# <u>2022 ජනවාරි මස 18 වන දින පැවති සෞඛ්‍යය, පරිසර, කෘෂිකර්ම හා රථවාහන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාව</u>

**සහභාගිත්වය**

| | | |
|---|---|---|
| 1. සුසිල් තිලකරත්න මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති |
| 2. එම්.පි.එම්.අන්සාර් මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 3. ඩබ්.එම්.සුපිනි සඳමාලි මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 4. සුරංගී ආර් සමරතුංග මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 5. එච්.බි.සිතා හේරත් මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 6. ඩබ්.එම්.රුවන් විජේසිංහ මහතා | - | නාගරික කොමසාරිස් |
| 7. ජයනී රාජකරුනා මිය | - | නාගරික ගණකාධිකාරී |
| 8. කේ.ජී.එන්.සි.බණ්ඩාර මහතා | - | නාගරික ඉංජිනේරු |
| 9. ජී.වි.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා | - | ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක |
| 10. එම්.ජී.සි.සනත් මහතා | - | ප්‍රධාන ආදායම් පරික්ෂක |
| 11. පද්මා සෙනෙවිරත්න මිය | - | සැළසුම් අංශ ප්‍රධානි |
| 12. ජේ.බි.මධුෂා ගයත්‍රී මෙනවිය | - | විෂය ලිපිකරු |

**නොපැමිණිම**

| | | |
|---|---|---|
| 1. ආර්.ඒ.විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |

❖ නාගරික කොමසාරිස්තුමා විසින් සෞඛ්‍ය, පරිසර, කෘෂිකර්ම හා රථවාහන පිළිබඳ ස්ථාවර කමිටුවේ 2022 වර්ෂය සඳහා නව සභාපති තෝරා ගැනිම සඳහා ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් සභාපති තෝරා ගැනිම පෙ.ව.10.00 ට සිදු කරන ලදි. කමිටුව සඳහා සහභාගිවූ ගරු නාගරික මන්ත්‍රීවරු 05 දෙනෙකු ලබාදුන් ඡන්ද පත්‍රිකා පරික්ෂා කිරිමේදී පැමිණි සිටි සියළුම නාගරික මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් නව සභාපති ලෙස ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා තේරි පත්විය. මෙම කමිටුවේ ඉදිරි වැඩ කටයුතු කර ගෙන යාම සඳහා නව සභාපති වන ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා වෙත භාර දෙන ලදී.

❖ කමිටුවේ සභාපති ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් ඡන්දය ලබාදුන් සියලුම නාගරික මන්ත්‍රීතුමන්ලාට ස්තුතිය ප්‍රකාශ කරමින් පැමිණ සිටි සියලු දෙනා පිළිගැනිමෙන් අනතුරුව කමිටුවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී.

1. අනුරාධපුර,3 වන පියවර,අංක:3038/ඒ,ස්වර්ණමාලි අනුරාධනායක මිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් පීඩාකාරි ජංගම වෙළඳ රථවලින් වන ශබ්ද දූෂණය හා ඉන් දෛනික කටයුතුවලට වන පීඩාව සම්බන්ධව අවධානය යොමු කරන ලෙස කල ඉල්ලීම.
   මෙම ඉල්ලීම මහා සභාවේ අවධානයට යොමු කිරිමට කීරණය විය. (වගකිම - පරිපාලන නිලධාරි)

2. අනුරාධපුර මුස්ලිම් අවමංගල්‍යා (ජනාසා) සේවා සංගමයේ ලේකම් එම්.එස්.එම්.අල්ෆාරිස් නාගරික මන්ත්‍රීතුමා විසින් ලිපියක් යොමු කරමින් මුස්ලිම් බැතිමතුන්ගේ මරණ භූමිදානය කිරිමේදී ප.ව.4.30 න් පසු මරණ භූමිදානය කිරිමට නොහැකි වන අතර ඒ හේතුවෙන් මුස්ලිම් ජනතාව පැය 24 ක් ඇතුලත භූමිදානය කිරිමට ද බැරි තත්ත්වයක් උදාවී ඇති බව සඳහන් කරමින් රජයේ නිවාඩු දිනයන් සහ ඕනෑම වේලාවක දී මුස්ලිම් මරණ භූමිදානය කිරිමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
   ඉහත කාර්ය පිළිබඳ අධ්‍යනය කර වාර්තාවක් ලබාදීමට තීරණය විය.(වගකිම - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක)

3. අනුරාධපුර මහා නගර සභා සීමාව තුල 2022 වර්ෂයේ අපද්‍රව්‍ය කළමනාකරණ වාර්ෂික සැළැස්ම මහා සභාවේ අවධානයට යොමු කිරිම.(ඇමුණුම 01) (වගකිම - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක)

4. ගරු නාගරික මන්ත්‍රී සුරංගී ආර් සමරතුංග මැතිතුමිය විසින් පරණ බස් නැවතුම්පල, නුවර වැව ATM යන්ත්‍රය අසල කාණු පද්ධතියේ අපද්‍රව්‍ය ජලය එක් රැස්වී තිබෙන බැවින් එම කාණු පද්ධතිය සුද්ධ පවිත්‍ර කර දෙන ලෙස කල ඉල්ලීම.
   එම ස්ථානයේ කාණු පද්ධතිය නිසි පරිදි ජලය බැස යන ලෙස සකස් කර දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලිපියක් යොමු කිරිමට තීරණය විය. (වගකිම - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක)

5. කමිටු සභාපති විසින් උදය මාවත සසෙක්ස් අධ්‍යාපන ආයතනය අසල කාණු පද්ධතියේ සවිකර ඇති අඟල් 6 ක ප්‍රමාණයේ බෝක්කුව ගලවා ඉවත් කර ජලය බැස යන ලෙස සකස් කර දෙන ලෙස කල ඉල්ලීම.
   මෙම කාණු පද්ධතිය සුද්ධ පවිත්‍ර කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු /ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක)

6. ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා විසින් සෑම කොට්ඨාශයකම සිටින සෞඛ්‍ය පරිපාලකගේ නම හා දුරකථන අංකය සහිත කුඩා ප්‍රමාණයේ ස්ටිකර් එකක් සකස් කර කොට්ඨාශයේ

සෑම නිවසක උළුවස්සේ ඇලවීමට සුදුසු බව කල යෝජනාව. මෙම යෝජනාව කමිටුව පිළිගත් අතර කොට්ඨාශ 14 තුල ක්‍රියාත්මක කිරිමට තීරණය විය. (වගකීම - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක)

7. කොට්ඨාශ 14 තුල ශ්‍රමදාන කටයුතු සිදුනොවුන කොට්ඨාශවල ශ්‍රමදාන කටයුතු ඉදිරියේදී පැවැත්වීමට කමිටුව තීරණය කරන ලදී. (වගකීම - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක)

සුසිල් තිලකරත්න,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,

සෞඛ්‍යය, පරිසර, කෘෂිකර්ම හා රථවාහන පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.